# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1757/3 - 2012 මැයි 09 වැනි බදාදා - 2012.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝග

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම ගැසට් නියෝගය මගින්,

(1) පහත දක්වා ඇති භාණ්ඩ ආනයනය කිරීම වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් නිදහස් කරනු ලබන බව ප්‍රකාශයට පත් කරමි.

(i) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16 ඇ හෝ 17 අ වගන්තිය යටතේ බදු විරාමයක් සඳහා සුදුසුකම්ලත් යම් ව්‍යවසායක් විසින්, 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා එම ව්‍යවසායේ භාවිතය පිණිස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළදී පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ වන යම් භාණ්ඩයක් ආනයනය කිරීමේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව සඳහන් කරන ලද කොන්දේසි සම්පූර්ණ කිරීමට යටත්ව එසේ ආනයනය කළ භාණ්ඩ සඳහා අයවිය යුතු බදු මුදල විලම්භනය කරන ලද්දේ නම් එම භාණ්ඩ.

(ii) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 අ වගන්තිය යටතේ බදු විරාමයක් සඳහා සුදුසුකම්ලත් ඉදිකිරීම් කටයුතු හා සම්බන්ධ යම් ව්‍යවසායක් විසින්, 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා එම ව්‍යවසායේ භාවිතය පිණිස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළදී එවැනි ව්‍යවසායක් මගින් ඉදිකිරීම් කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් ප්‍රකාශනයට පත් කරන ලද නිශේධක ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ නොවන, ශ්‍රී ලංකාව තුළ දී සපයාගත නොහැකි සහ එම කාර්යය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරනු ලැබූ ඉල්ලීමකට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ නිර්දේශය මත ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ නොවන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන භාණ්ඩ.

(iii) සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම, සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් පුද්ගලික සමාගම යන ආයතන නමින් ආනයනය කරන ලද අන්තර්ජාතික ප්‍රවාහන පහසුකම් සපයා දීම සඳහා වන්නා වූ භාණ්ඩ (එහෙත් මෝටර් වාහන සහ පෞද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා භාණ්ඩ හැර).

(2) 2008 දෙසැම්බර් මස 31 වැනි දින අංක 1582/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි I වැනි කොටසේ උපලේඛනයේ I වැනි තීරුවෙහි ශීර්ෂ අංක 29.00 යටතේ සඳහන් සෑම භාණ්ඩයක් සඳහාම ඊට අනුරූපව III වැනි තීරුවෙහි සඳහන් වූ විස්තරය පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

උපලේඛනය

| I | II | III | IV |
|---|---|---|---|
| *සං. ව. ශීර්ෂය* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *විස්තරය* | *සහන අනුපාතය* |
| 29.00 | | කාබනික රසායන ද්‍රව්‍යයන්<br>* අදාල රජයේ ආයතනයේ අනුමැතියට යටත්ව ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය | 2% |

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2012 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

05 - 573

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.